ශ්‍රී ලංකා මහ බැංකුව
2026 මාර්තු 31 වැනි දිනට ශේෂ පත්‍රය

(රුපියල්)

පෙබරවාරි 2026		වගකීම් සහ හිමිකරු ප්‍රාග්ධනය	මාර්තු 2026		පෙබරවාරි 2026		වත්කම්	මාර්තු 2026	
		විදේශීය මූල්‍ය බැරකම්					**විදේශීය මූල්‍ය වත්කම්**		
148,119,183,728		බැංකු සහ මූල්‍ය ආයතන	61,242,273,393		1,159,675,380,277		මුදල් සහ මුදල් සමානයන්	928,070,709,917	
21,396,227,851		ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	29,452,286,239		1,162,663,823,542		ලාභ හෝ අලාභ තුළින් සහ අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	1,269,703,686,390	
795,502,989,208		ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වගකීම්	801,062,333,869						
716,020,670,747	1,681,039,071,534	අනෙකුත්	656,741,364,652	1,548,498,258,153	2,026,788,365		ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	23,704,619	
					247,346,835,293		ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්	248,029,809,249	
					7,524,419,315	2,579,237,246,792	අනෙකුත් ලැබිය යුතු දෑ	1,363,559,918	2,447,191,470,093
		දේශීය මූල්‍ය බැරකම්					**දේශීය මූල්‍ය වත්කම්**		
240,406,977,589		බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	252,824,305,139						
2,817,149,521		රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	2,960,448,058		1,858,188,312,628		ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	1,778,067,176,238	
359,316,860,838		ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්	278,001,440,692		400,181,319		නැවත විකිණීමේ ගිවිසුම මත මිලදී ගත් සුරැකුම්පත්	-	
7,893,583,974		විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	7,872,378,572		46,834,022		මූල්‍ය සහ අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	46,834,022	
1,608,551,235,477		සංසරණයෙහි පවත්නා මුදල්	1,717,300,706,905		5,418,490,299		බැංකු සඳහා දෙන ලද ණය	5,391,838,110	
34,481,501,095	2,253,467,308,494	අනෙකුත් ගෙවිය යුතු දෑ	33,738,741,058	2,292,698,020,424	17,568,400,000		විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	17,568,400,000	
					43,395,869,478	1,925,018,087,746	අනෙකුත් වත්කම්	41,835,540,357	1,842,909,788,727
		අනෙකුත් බැරකම්							
							විදේශීය මූල්‍ය නොවන වත්කම්		
18,945,305		විලම්භිත ප්‍රදාන	18,945,130						
539,594,545	558,539,850	විවිධ බැරකම් සහ උපචිතයන්	507,829,349	526,774,479	61,945,190,711	61,945,190,711	රන්	69,942,984,179	69,942,984,179
							මූල්‍ය නොවන වත්කම්		
		හිමිකරු ප්‍රාග්ධනය							
					4,290,653,354		තොගය	3,190,312,426	
50,000,000,000		ප්‍රාග්ධන අරමුදල	50,000,000,000		8,471,018,372		අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම්	8,525,824,459	
521,678,812,890		අනෙකුත් සංචිත	457,578,139,361		23,803,639,095		දේපළ, පිරියත සහ උපකරණ	23,759,648,714	
96,237,953,707	667,916,766,597	රඳවාගත් ලාභ	46,427,663,376	554,005,802,737	215,850,405	36,781,161,226	අස්පෘශ්‍ය වත්කම්	208,827,195	35,684,612,794
	4,602,981,686,475			**4,395,728,855,793**		**4,602,981,686,475**			**4,395,728,855,793**
31,593,162,313		රජයේ විදේශ ණය හා ඇපකර	36,939,766,319		31,593,162,313		රජයේ විදේශ ණය හා ඇපකර	36,939,766,319	

2026 අප්‍රේල් 23 දින
කොළඹ දීය.

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති

ඒ. එස්. එල්. සිරිමාන්න
ප්‍රධාන ගණකාධිකාරී

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2026 මාර්තු මස 31 දිනට ශේෂ පත්‍රය සමාලෝචනය පිළිබඳ වාර්තාව

විගණකාධිපති වාර්තාව :-

හැඳින්වීම

මේ සමඟ වන, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2026 මාර්තු මස 31 දිනට ශේෂ පත්‍රය මා විසින් සමාලෝචනය කරන ලදී. මෙම ශේෂ පත්‍රය පිළියෙල කිරීම හා ඉදිරිපත්කිරීම කළමනාකරණයේ වගකීම වේ. මාගේ සමාලෝචනය මත පදනම්ව මෙම ශේෂ පත්‍රය පිළිබඳව නිගමනයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

සමාලෝචන විෂයපථය

ආයතනයෙහි ස්වාධීන විගණක විසින් එහි අතුරු මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම සඳහා අදාල වන, සමාලෝචන කාර්යයන් සම්බන්ධ ශ්‍රී ලංකා ප්‍රමිතිය - 2410 ට අනුකූලව මාගේ සමාලෝචනය සිදු කරන ලදී. ශේෂ පත්‍රය සමාලෝචනය කිරීම, මූල්‍ය හා ගිණුම් කටයුතු සඳහා මූලිකවම වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් කරනු ලබන විමසීම් සහ අනුගමනය කරනු ලබන විශ්‍රහාත්මක හා අනෙකුත් සමාලෝචන පරිපාටීන්ගෙන් සමන්විත වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරනු ලබන විගණනයකට වඩා සමාලෝචන විෂය පථය සැලකිය යුතු ලෙස අඩුවන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් විගණනයේදී මෙන් හඳුනාගත හැකි සියලු වැදගත් කරුණු පිළිබඳව මම දැනුවත් වන බවට සහතිකයක් මට ලබා නොදෙනු ඇත. ඒ අනුව, මම විගණන මතයක් ප්‍රකාශ නොකරමි.

නිගමනය

මාගේ සමාලෝචනය මත පදනම්ව, මේ සමඟ වන ශේෂ පත්‍රය සියලුම ප්‍රමාණාත්මක ආකාරයන්ගෙන් පිළියෙල කළ නොමැති බවට විශ්වාස කිරීමට තුඩුදෙන කිසිවක් මාගේ අවධානයට යොමු නොවීය.

2026 මස දින
ජාතික විගණන කාර්යාලයේදී ය

එල්. එස්. අයි. ජයරත්න
විගණකාධිපති